052914
2015/07/21
NL/PR
D-830

# වෙල්ලස්සේ අභිචාරවිධි

# හැඳින්වීම

**'වෙල්ලස්ස'** මොණරාගල දිස්ත්‍රික්කයට අයත් ඉපැරණි ඉතිහාසයක් සහ ඓතිහාසික වටිනාකමක් ඇති ප්‍රදේශයකි. විවිධ වූ ඇදහිලි සහ විශ්වාස මෙන්ම ඒ හා බැඳි අභිචාරවිධි බොහෝමයක් මෙම ප්‍රදේශයේ දක්නට ඇත. ඒවා ජන ජීවිතය හා බැඳී පවතින්නේ මිනිසා තුළ පැවති විවිධ වූ අපේක්ෂාවන් ඉටු කරමිණි. මේ පිළිබඳ මෙතෙක් කිසිවෙකු හෝ විසින් ප්‍රාමාණික අධ්‍යයනයක් සිදුකොට නොමැති බැවින් ඒ පිළිබඳ අධ්‍යයනයක් කිරීම මෙම නිබන්ධනයේ අභිප්‍රාය වේ.

විද්‍යාත්මක චින්තන ක්‍රමයන් මිනිසා වෙත නැඹුරුවන්නට ප්‍රථම ආදි මනුෂ්‍යයා තුළ පැවති නොදැනුවත්කම, විවිධ වූ විශ්වාස මත එල්බ සිටින්නට හේතුවිය. සමස්ථ සමාජයටම පොදු ක්‍රියාවලියක් වූ එය වෙල්ලස්ස ප්‍රදේශයට පමණක් ආවේනික වුවක් යයි සිතීම යුක්ති යුක්ත නොවේ. මිනිසා බිය හා ආරක්ෂක හේතුන් මත තම පරිසරයේ ඇති විවිධ වස්තූන් හා ස්වාභාවික බලපෑම් දේවත්වයෙන් ඇදහීමටත් පුරුදුවී ඇත. එය වෙල්ලස්සට ද පොදු වූ ධර්මතාවයකි.

වෙල්ලස්ස ප්‍රදේශයේ අභිචාරවිධි පිළිබඳ අධ්‍යයනයේදී එකම ප්‍රදේශය තුළම සුළු සුලු වෙනස්කම් වලට බඳුන්ව පැවතීම මෙහි විශේෂත්වයකි. විද්‍යාත්මක අතින් දියුණු ලෝකයට පා තබන වර්තමානයේ වෙල්ලස්ස ප්‍රදේශය ඒ හා ළඟා වනුයේ ඉතා සෙමිනි. ඒ අනුව බලනවිට අභිචාරවිධි වල පිහිට වත්මනෙහිත් අපේක්ෂා කරයි. වෙල්ලස්ස සමාජයේ ප්‍රගමනයට එය යම් තරමකින් හෝ දායකවීමක් දැකිය හැක. මෙම මාතෘකාව කෙරෙහි නැඹුරුවී ඒ පිළිබඳව කරුණු සෙවීම අසීරු කාර්යයක් වුවත් වැළලිගිය අතීතයත්, සංස්කෘතියක් නැවත මතුකරගැනීමට තැත් කිරීමක් ලෙස දැක්විය හැක. ඒ තුළ ඇති විවිධ වූ සම්ප්‍රදායික ලක්ෂණ මෙන්ම අභිචාරවිධි සහ ශාන්තිකර්ම බොහෝ සෙයින් මිනිසා හා බැඳී තිබේ.

වෙල්ලස්සේ ඉතිහාසය පිළිබඳ හැඳින්වීමක් පළමු පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. එපමණක් නොව වෙල්ලස්සේ භූමි ප්‍රමාණය සහ බෙදීම්, ආර්ථික තත්ත්වය, පුරාණ අධ්‍යාපනය, වැදි ජන ජීවිතය, වෙල්ලස්සේ බස් වහර, පුරාණ වෙදකම, කලා නිර්මාණ පිළිබඳ පැහැදිලි කිරීමක් කෙරේ. වෙල්ලස්ස

ප්‍රදේශයේ ඉතිහාසය පිළිබඳව අවබෝධයක් ඇති කිරීම මෙහි පරමාර්ථය වන අතර වෙල්ලස්ස පිළිබඳ අවබෝධය ලබා දීම මින් අපේක්ෂා කෙරේ.

ලෝකයේ ඕනෑම රටක ප්‍රාථමික සමාජයන් තුළ විවිධ වූ ඇදහිලි විශ්වාස සහ අභිචාරවිධි දක්නට ඇත. ඒ අනුව වෙල්ලස්ස ප්‍රදේශයේ අභිචාරවිධි පිළිබඳ විමසීමක් දෙවැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. අභිචාර යන්නෙහි අර්ථ දැක්වීමත්, එය ලෝකය පුරා පවත්නා ආකාරයත් වෙල්ලස්ස ප්‍රදේශයේ අභිචාරවිධි ජන විශ්වාසය දිනා ඇති අයුරු සහ විවිධ අභිචාර ක්‍රම මින් විස්තර කෙරේ.

අභිචාරවිධින්හි පුද ලබන්නෝ යක්ෂ හා දේව කොට්ඨාසයන්ය. ඔවුන් සමාජය අරක්ගෙන සිටී. ඔවුන්ට පිදවිලි දීම සහ ඉන් තම අපේක්ෂාවන් ඉෂ්ඨ සිද්ධ කර ගැනීම කවර සමාජයක වුව දක්නට ලැබේ. එමෙන්ම මෙම යක්ෂ දේව කොට්ඨාස ලංකාවේ වෙනත් ප්‍රදේශවල හා කවර සාම්‍යක් දක්නට ලැබේද යන්න අභිචාරවිධින්හි පුද ලබන යක්ෂ දේව කොට්ඨාස නම් තුන්වෙනි පරිච්ඡේදය යටතේ ගෙන හැර දක්වයි. මේ යටතේ ඔවුන්ට සමාජයේ පැවරී ඇති කාර්ය භාරය සහ ඔවුන්ගෙන් සමාජය අපේක්ෂා කරන්නේ කුමක් ද යන්න විමර්ශනය කෙරේ.

සිව්වැනි පරිච්ඡේදයෙන් අභිචාරවිධි රාශියක සංකලනයෙන් එම ප්‍රදේශයට ආවේණික වූ හා දුර්ලභ වූ ප්‍රධාන ශාන්තිකර්මයන් මෙන්ම කුඩා ප්‍රමාණයේ ශාන්තිකර්ම පිළිබඳව විමසුමක් ඉදිරිපත් කෙරේ. එමෙන්ම ඒවා සමාජයට කුමන කාර්ය භාර්යක් ඉටුකරන්නේද යන්න මෙම පරිච්ඡේදයෙන් විග්‍රහ කෙරේ.

සමාජීයීය වටිනාකම් ඕනෑම සමාජයක් ඉදිරියට ගෙන යාමට හේතු සාධක වේ. වෙල්ලස්ස සමාජයේ අභිචාරවිධි වෙල්ලස්ස සමාජයේ ප්‍රගමණයට බොහෝ සෙයින් දායක වේ. ඒ අනුව අභිචාරවිධි වෙල්ලස්සේ ප්‍රගමණයට දායක වී ඇති අයුරු පස්වැනි පරිච්ඡේදයෙන් සකච්ඡා කෙරේ. වෙල්ලස්ස මිනිස් සමාජය මේ හා බැඳී පවතින්නේ කෙසේද? ඔවුන්ගේ පෞද්ගලික සහ පොදු අවශ්‍යතාවයන් මේ තුළින් ඉෂ්ඨ කරගැනීම මත ඔවුන්ගෙ ජීවිත වල ඇති අධ්‍යාත්මික අවශ්‍යතාවයන් සහ මිනිස් අවශ්‍යතාවයන් ඉෂ්ඨ සිද්ධ කිරීම තුළ එය සමාජයේ දියුණුවට හේතු සාධක වී ඇති අයුරු මෙහිදී සාකච්ඡා කෙරේ.